# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0439 925 241

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380



## කැබිතිගොල්ලෑව කොටි ප්‍රහාරය
# කොටින්ට ජාත්‍යන්තර අපවාදයක්

**ශ්‍රී ලාල් ප්‍රියන්ත**

කොටි සංවිධානය කැබිතිගොල්ලෑවේ දී කළ මහා මිනිස් සංහාරය මෙරට සමස්ත ජන සමාජයම මහත් කම්පාවට පත්කළ තවත් ශෝචනීය සිදුවීමක් විය.
පසුගිය ජූනි මස 15 වැනිදා පෙරවරු 7.30 ට පමණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථයක් ඉලක්ක කරගෙන ක්ලෝමෝ බෝම්බ දෙකක් පුපුරවා හැර කළ ඒ තිරිසන් ක්‍රියාවෙන් අහිංසක නිරායුධ සාමාන්‍ය වැසියන් 67 දෙනෙකු මිය ගොස් තවත් 96 දෙනෙකු බරපතල හා සුළු තුවාල ලැබූ හ.
2002 පෙබරවාරි මස 22 වැනි දා සටන් විරාම ගිවිසුම අත්සන් කළ පසු ගත වූ වසර 4 කට ආසන්න කාලය තුළ සිදු වූ බරපතලම මිනිස් සංහාරය ලෙස මෙය සැලකේ. මේ මිහිතලය නුහුල්ලන කොටින්ගේ තවත් ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාරයක් ලෙස ඉතිහාසයට එක් වූ මෙය ජාත්‍යන්තර ප්‍රජාවගේ දැඩි දෝෂ දර්ශනයට ලක් විය.
මෙය හෙළා දකිමින් ඇමෙරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව, යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කොෆී අනාන් ඇතුළු රාජ්‍ය නායකයන් නිවේදන නිකුත් කළ අතර මෙහි තවත් සුවිශේෂී වූ සිදුවීමක් ද විය.
එනම්, 16 වැනි බෙනඩික් ජෝශප් ශුද්ධ වූ ජුවාම් පාවුළු පාප් වහන්සේ පවා වතිකානුවේ සිට නිවේදනයක් නිකුත් කරමින් කොටි සංවිධානය වහාම ත්‍රස්තවාදී ක්‍රියා නතර කර සාම මාවතකට පිවිසිය යුතු බව කියා සිටීමයි. උන්වහන්සේ ආවාට ගියාට නිවේදන නිකුත් කරන්නේ නැත. සිද්ධියේ ස්වභාවය හා බරපතලකම මූලික වශයෙන් සැලකිල්ලට ලක් කෙරේ. ඒ අතින් බලන කල කොටින්ගේ මෙම තිරිසන් ක්‍රියාව පාප් වහන්සේගේ හෘද සාක්ෂියට මොනතරම් බරපතල විදියට දැනී ඇද්ද යන්න මනාව වැටහෙනවා ඇත.
කැබිතිගොල්ලෑව ප්‍රහාරය කරුණා අම්මාන්ගේ පාර්ශවයට බැර කිරීමට කොටි සංවිධානය හා ඔවුන්ගේ හිතවත් පිරිස් බරපතල උත්සාහයක යෙදුණි. කොටි සංවිධානය ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ බරපතල අර්බුදයට ලක්කිරීම උදෙසා කොටින්ට මුවා වී කරුණා පාර්ශවය මෙය කර ඇතැයි යන්න ඔවුන්ගේ තර්කය විය. නමුත් එය එතරම් සාර්ථක වූයේ නැත. ප්‍රහාරයේ ස්වභාවය දෙස බලනවිට එවැනි දෙයක් කොටින් හැර වෙනත් පිරිසක් කිරීමට ඇති ඉඩප්‍රස්තා ඉතාම අවම ය. මෙය කොටින්ගේම ප්‍රහාරයක් බවට ඕනෑම අයකුට බැලූ බැල්මටම පැහැදිලි වෙනවා ඇත.
මෙම ප්‍රහාරය එල්ල කිරීමෙන් ඇතිවන දෙස් විදෙස් අවධානය හා ආරක්ෂක අංශවල ක්‍රියාකාරීත්වය අඩාල කිරීමට කොටි එදිනම තවත් ප්‍රහාරයක් මන්නාරම පේසාල මුහුදු තීරයේ එල්ල කළේ ය. ඒ ජූනි මස 15 වැනි දා පෙරවරු 6.25 ට පමණ ය. ඒ මොහොත වනවිට සැක කටයුතු බෝට්ටු කිහිපයක් පේසාල මුහුදු තීරයේ නිසොල්මනේ තිබෙන බවට පේසාල පොලීසියට තොරතුරු ලැබී ඇත. පොලීසිය වහාම මෙය නාවිකා හමුදාවට දැනුම් දී ඇත. නාවිකා හමුදාවේ ලුතිනන් දළුගමගේ නායකත්වයෙන් යුත් භට පිරිසක් ඩිංගි බෝට්ටු තුනකින් එම සැක කටයුතු බෝට්ටු පරීක්ෂා




මේ හඬා වැටෙන්නේ පසුගිය දා මරා දැමුණ සත්දින ආරක්ෂක තොරතුරු වාර්තාකරු සම්පත් ලක්මාල් ද සිල්වා ගේ මවයි.

අද මාධ්‍යවේදීන් මුහුණ දෙමින් සිටින අවදානම මේ ඝාතනය මැනැවින් පෙන්වා දෙයි. ලක්මාල් මරා දැමුවේ කව්රුන් ද යන්න ඉදිරියේ දී හෙළිදරව් වන්නට ඉඩ ඇත. එසේ නොවේ නම් ශ්‍රී ලංකාවේ සිදුවූ බොහෝ ඝාතන මෙන් මේ ඝාතනය ද තවත් නොවිසඳුන අබිරහසක් බවට පත් කෙරෙණු ඇත. ඒ කිසිවක් අපට වැදගත් නැත. අපට වැදගත් වන්නේ මාධ්‍යවේදීන්ට මරණ බයකින් තොරව සිය වෘත්තිය කරගෙන යාමට සුදුසු පරිසරයක් බිහි කරන්නට අදාල බලධාරීන් කටයුතු කරන්නේ ද යන්න පමණ කි

මාධ්‍යවේදී ඝාතන ගැන නිවේදනයක් නිකුත් කරන එක්සත් ජාතීන් ග් සංවිධානයේ යුනෙස්කෝ වේ අධ්‍යක්ෂ ජනරාල් Koïchiro Matsuura දැක්වූ මේ අදහස ඉතා වැදගත් ය.
“***To continue to do their job of informing the public without restriction, they are permanently exposed to the violence that has become so horrifyingly commonplace. We salute their courage, but we must also do the utmost to improve their security***.”

මාධ්‍යවේදීන් ඝාතන සන්නසේ අපි තරයේ හෙළා දකින්නමු..